## වේෂ භූෂණය හෙවත් වෙස් මෝස්තර රචනය Costume designing

භරතමුණි නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වූ සතර අභිනය අතරින් ආහාර අභිනයන් ප්‍රකාශ වන්නේ වෙස් මෝස්තර රචනයයි. වෙස් මෝස්තර නිර්මාණය, රංගවස්ත්‍ර නිර්මාණය, ඇඳුම් පැළඳුම් නිර්මාණය නාමයන්ගෙන් එය හඳුන්වනු ලබයි. නළුවා චරිත නිරූපණයේදී පවත්නා සැබෑ ස්වරූපයෙන් බැහැර වෙනත් පුද්ගලයකු විලාසයකට ආරෝපණය වෙන රංග කලාවේ නිර්මාණාත්මක කාර්යයක් වූ බාහිර සමාරෝපය ගොඩනහා ගන්නේ අංග රචනය හා වෙස් මෝස්තර වචනයෙනි.

නළු භූමිකාව පිළිබඳ දෘශ්‍ය සංඥා සංකේත රැසක් වෙස් මෝස්තර රචනය හරහා ප්‍රේක්ෂකයාට සන්නිවේදනය කරයි. නාට්‍යයක සාර්ථකත්වයට නිර්මාණාත්මක රංග වස්ත්‍ර අත්‍යවශ්‍ය සාධකයකි. මන්ද දෛනික ජීවිතයේ දී මෙන්ම කෙටි කලක දී මුල්වරට වේදිකාවක් මත පුද්ගල චරිත පිළිබඳ ප්‍රේක්ෂක මනසේ ප්‍රතිරූප ගොඩනගා ගන්නේ නළුවාගේ බාහිර සමාරෝපයෙනි .නළුවාට තම චරිතයට මනාව පිවිසෙමින් රංග කාර්යය සාර්ථක කර ගැනීමට රංග වස්ත්‍රාභරණ රංගවස්ත්‍රාභරණ මනා උපකාරී වේ.

### නාට්‍යයකට වේෂ භූෂණ යොදා ගැනීමේ වැදගත්කම

- නාට්‍යයක සාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් වෙස් මෝස්තර රචනා ප්‍රබල මෙහෙයක් ඉටු කරයි.ප්‍රේක්ෂක රසවින්දනයට ආසන්නතම හේතුවක් ලෙස නළු කාර්යය සාර්ථක කර ගැනීමට ආධාරකයක් ලෙසත් මෙම වෙස් මෝස්තර රචනය හැඳින්විය හැකිය .එසේම ප්‍රේක්ෂකයාට අදාළ චරිතය පිළිබඳව ප්‍රථම අවබෝධය ලබා ගන්නේ මෙමගිනි.

- අධ්‍යක්ෂක වරයාගේ සිතේ උපන් චරිතයන් වේදිකාව හරහා පොදු අත්දැකීමක් බවට පත් කිරීමේදී අංග රචනය රංග වස්ත මෙන්ම මෝස්තර නිරූපණය සුවිශේෂී කාර්යයක් ඉටු කරයි.

- ප්‍රේක්ෂකයා වෙත දෘශ්‍ය සංඥා සම්ප්‍රේෂණය කිරීමේ සුවිශේෂී කාර්ය භාරයක් වෙස්මෝස්තර නිරූපන ශිල්පියාට හිමිවේ

- චරිත තුළ පවතින විවිධ ලක්ෂණ විවිධත්වය, අභ්‍යන්තර සහ බාහිර ලක්ෂණ ආදී සියලු ගුණාංග ප්‍රභලව දැක්වීමේ හැකියාවක් ඇත.

- නාට්‍ය තේමාවට අදාළ වන භූගෝලීය පසුබිම දැක්වීමේදී වෙස් මෝස්තර රචනය ප්‍රබල ව භාවිතා වෙයි .නාට්‍ය කෘතියෙන් කියවෙන රට,ප්‍රදේශය, කාලය, දේශගුණික තත්ත්වය, පැලැන්තිය, යුගය අනාවරණය කිරීමට හැකියාව ඇත.

- වෙස් මෝස්තර රචනය තුළින් නාට්‍යයේ ශෛලිය පිළිබඳව ප්‍රේක්ෂකයාට අවබෝධයක් ලබාගත හැකිය

- වෙස් මෝස්තර හරහා චරිතය පිළිබඳ මනා විවරණයක් ලබා දෙයි .එලෙසම නළුවා නිරූපණය කරන චරිතය චරිතයේ ස්වභාවය මනා ලෙස අවබෝධ කර ගැනීමෙන් නාට්‍යයේ රසය උපරිම ලෙස ප්‍රේක්ෂකයාට විඳගැනීමට වෙස් මෝස්තර දායක වේ.

- නළුවාගේ බාහිර සමාරෝපය සඳහා වෙස් මෝස්තරය ප්‍රබල ලෙස දායක වේ

**වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු**

- නාට්‍යයේ ස්වභාවය
- කතා වස්තුවට පසුබිම් වන යුගය
- භූගෝලීය පසුබිම
- චරිත සහ චරිත ස්වභාවය
- නළුවාගේ ශරීර ප්‍රමාණය සමේ වර්ණය
- පසුතල වර්ණ සහ රංගාලෝකය සමඟ ගැලපෙනවාද යන බව
- නළුවාට පහසුවෙන් පැළඳිය හැකි අයුරින් නිර්මාණය විය යුතු බව

ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍යයේ ඇඳුම් නිර්මාණයේ දී යොදා ගන්නා වර්ණ ඊට ආවේනික ආවේණික අර්ථ ප්‍රතිනිර්මාණය කරයි. ඒ අනුව

**සුදු වර්ණය-** පාරිශුද්ධභාවය සහ සංයමය, ආලෝකය, අවාසනාව, ශෝකය

**රතු වර්ණය -** අපිරිසිදු බව නැතහොත් කිලි සහිත බව, අන්තරාව, රාගය, ලේ, භයානක බව සහ විප්ලවය

**කළු වර්ණය-** නපුරුකම, රාගය, නරක, මරණය, දුක, රය, අඳුර, නිරය

**කහ-** පාරිශුද්ධ බව, ඥානවන්ත බව, පිත, බලය, බෞද්ධ පරිසරය, තාරුණ්‍ය, සුන්දර බව

**නිල්-** බලය, ජීවිතය, කරුණාව , ඉවසීම

**දම් -**රාජකීය බව, වීරත්වය,සදාචාර සම්පන්න බව

**දුඹුරු පැහැය-** භක්තිය,දුක .

**තැඹිලි පැහැය-** උණුසුම, සශ්‍රීකත්වය

**කොළ පැහැය-** හරිත ලක්ෂණ, තරුණ බව ,ජීවය

**අළු පැහැය-** මලානික බව දුක

රංග වස්ත්‍ර නිර්මාණය කරන යෙදි නළු භූමිකාවයේදි නළු භූමිකාව තීව්‍ර කරනු විනා භූමිකාව අලංකරණය නොවිය යුතුය චරිතයට ඉතාම උචිත ඇඳුම යොදා ගැනීම ද අනිවාර්ය වේ

<u>පැවරුම</u>

ලෝක ධර්මී සහ නාට්‍ය ධර්මී ශෛලිය ට අදාළව චරිත සඳහා වේෂ භූෂණ නිර්මාණයන් දෙකක් මැද දක්වන්න